## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 2013

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරීත්ව වාර්තාව, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 26 දරන බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනතේ සහ 2012 අංක 15 දරන ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 46 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිත වලට (ISSAI 1000-–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරික්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104 (1), 104 (3) හා 104 (4) | 2012 වර්ෂයේදී සිදු වූ වාහන අනතුරකින් රු.94,765 ක අලාභයක් සිදු වී තිබූ අතර එයින් රු.88,606 ක් රක්ෂණ වන්දි යටතේද රු. 6,159 ක් විශ්වවිද්‍යාල අරමුදලින්ද ගෙවා තිබුණි. අනතුරුවලට වගකිවයුතු පුද්ගලයින් හඳුනාගැනීම සඳහා පරික්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>8.13.4 ඡේදය | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වාහන ගරාජයක් ඉදිකිරීමේදී අනුමත ඇස්තමේන්තු අගයට වඩා සියයට 110 ඉක්මවා රු.137,812 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

### 2.2.2 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාලක සභාවෙන් පූර්ව අනුමැතිය ලබානොගෙන වැය විෂයයන් 17 කට අදාළව රු.5,554,429 ක් ඇස්තමේන්තු ඉක්මවා වියදම් දරා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම්වලට අදාළ උපදේශන කටයුතු ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු අංශය මඟින් ඉටුකරගැනීම සඳහා ගිවිසුම්වලට එළඹ ඒ වෙනුවෙන් රජරට විශ්වවිද්‍යාලය වෙත උපදේශන සේවා ගාස්තු ගෙවා තිබිය දී ඊට අතිරේකව රජරට විශ්වවිද්‍යාලයේ උපදේශක ඉංජිනේරුවරයෙකුට සමාලෝචිත වර්ෂය තුළදී රු.108,000 ක් ගෙවා තිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු වලින් රු.1,496,395 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.25,060,055 ක් විය.

### 3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණ රු.108,050,000 ක මුදලින් සහ ස්වයං උත්පාදිත රු.3,594,278 ක ආදායමින් වර්ෂයේ වියදම් දැරීමෙන් පසු ඌනතාවය රු.1,128,996 ක් විය. ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මහාභාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රු. 81,450,000 ක මුදලින් හා ස්වයං උත්පාදිත රු.2,335,379 ක ආදායමින් වියදම් දැරීමෙන් පසු ඌනතාවය රු.3,109,622 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හරින ලද ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය රු.34,446,367 ක්ද පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.1,981,813 ක්ද වශයෙන් එකතුව රු.36,428,180 ක් ලියාහැරීම සමාලෝචිත වර්ෂයේ ඌනතාවයට හේතු වී තිබුණි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදනය රු.19,971,416 ක් හා , පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදනය රු.21,950,433 ක් ලියාහැරීම, ඉකුත් වර්ෂයේ ඌනතාවය වැඩිකිරීමට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එක් එක් වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි කල , අධ්‍යාපනය ලැබූ, අවසන් විභාගයට පෙනී සිටි සහ උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව පහත පරිදි විය.

| වර්ෂය | එක් එක් වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යාපනය ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2008 | 98 | 243 | 30 | 26 |
| 2009 | 63 | 264 | 88 | 49 |
| 2010 | 53 | 222 | 124 | 96 |

| | | | | |
|---|---|---|---|---|
| 2011 | 93 | 200 | - | - |
| 2012 | 101 | 223 | 66 | 56 |
| 2013 | 101 | 276 | 50 | 41 |

2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී අධ්‍යාපනය ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කර තිබූ නමුත්, අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාවේ අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

(ආ) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ එක් එක් වර්ෂයේ පුනරාවර්තන වියදම් හා ඒක ශිෂ්‍ය පිරිවැය පහත පරිදි විය.

| වර්ෂය | පුනරාවර්තන වියදම් | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|---|---|
| | රු. | | රු. |
| 2008 | 51,033,645 | 243 | 210,015 |
| 2009 | 57,609,816 | 264 | 218,219 |
| 2010 | 58,211,952 | 222 | 262,216 |
| 2011 | 70,845,000 | 200 | 354,225 |
| 2012 | 88,874,619 | 223 | 398,541 |
| 2013 | 108,624,854 | 276 | 393,568 |

(ඇ) 2013 වර්ෂයේ දේශන පැවැත්වීම පිළිබඳ ප්‍රගතිය

| | විෂයය | සැලසුම්ගත දේශන පැය | පැවැත්වූ දේශන පැය | දේශන පැවැත්වීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| (i) | සිංහල | 360 | 302 | 84 |
| (ii) | සංස්කෘත | 330 | 160 | 48 |
| (iii) | ඉංග්‍රීසි | 330 | 266 | 81 |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | අනිවාර්ය ඉංග්‍රීසි | 990 | 821 | 83 |
| (v) | බෞද්ධ දර්ශනය / පාලි/ බෞද්ධ සංස්කෘතිය | 4110 | 3970 | 97 |

55552013 වර්ෂයේ සංස්කෘතික විෂයට අදාළ දේශන පැවැත්වීම අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 48ක 5555මට්ටමක පැවැතුණි.

## 4.2 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 04 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් ලේඛකාධිකාරී හා මූල්‍යාධිකාරී යන ප්‍රධාන තනතුරු 02 සඳහා 2012 වර්ෂයේ සිට ස්ථිර සේවකයන් පත් නොකර වෙනත් විශ්වවිද්‍යාලවල සප්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණෙන නිලධාරීන් තාවකාලික පත්කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබුණු අතර විශ්වවිද්‍යාලයේ කාර්යක්ෂම පරිපාලනයක් පවත්වාගෙන යෑම සඳහා එය ගැටළු සහගත තත්වයක් බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පරිපාලන නොවන තනතුරු සඳහා 2013 වර්ෂයේ පරිගණක යෙදවුම් සහකාර II ශ්‍රේණියේ තනතුරට අදාළව නිලධාරීන් 05 දෙනෙකු අදාළ බඳවා ගැනීම් පරිපාටියෙන් පරිබාහිරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබූ නාමලේඛනයක් පදනම් කරගෙන බඳවා ගෙන තිබුණි.

## 4.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ රු. 68,062,631 ක් වූ ඇස්තමේන්තුව 2009 අගෝස්තු 04 දින ඉදිකිරීම් හා ඉංජිනේරු සේවා අමාත්‍යාංශයේ ස්ථාවර තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් අනුමත කර තිබුණි. ඒ අනුව අනුමත ඇස්තමේන්තුව පදනම් කරගෙන උපදේශන ගාස්තු ගෙවියයුතු වුවත්, ඉංජිනේරු සංස්ථාවේ ඇස්තමේන්තු මිල වූ රු.87,030,584 පදනම් කරගෙන ගෙවීම් කර තිබීම හේතුවෙන් උපදේශන ගාස්තු රු.1,210,914 ක් වැඩිපුර ගෙවා තිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

සහකාර අභ්‍යන්තර විගණකගේ සේවය 2013 මැයි 27 දින සිට අවසන් කර තිබූ අතර එදින සිට එම තනතුර පුරප්පාඩුව පැවතුණි. අභ්‍යන්තර විගණන අංශය සඳහා සහාය කාර්ය මණ්ඩලයක්ද අනුමත කර නොතිබූ බැවින් වර්තමානයේ ආයතනයේ අභ්‍යන්තර විගණනය සතුටුදායක මට්ටමින් ක්‍රියාත්මක නොවුණි.

**5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2010 වාර්ෂික වාර්තාව 2013 අගෝස්තු 19 දින සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට භාර දී තිබූ අතර 2012 වර්ෂයේ වාර්ෂික වාර්තා විගණන දින වන විටත් සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව, මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලැබූ විස්තරාත්මක වාර්තාව මඟින් විශ්වවිද්‍යාලයේ මහෝපධ්‍යායයන් වහන්සේ දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) අයවැය පාලනය